සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**08 ශ්‍රේණිය** | **ක්‍රිස්තියානි ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මනුෂ්‍යයා දේව මැවිල්ලේ,
    (1) භාරකරුය. (2) අයිතිකරුය. (3) නිර්මාතෘවරයාය. (4) විනාශකරුවාය.

02. දෙවියන් වහන්සේ තම ස්වරූපයට හා සමානත්වයට අනුව අප මවනු ලැබීම තුළින් පෙනී යන්නේ,
    (1) දෙවිඳුන් අප සමඟ ඇති සමානත්වතාවය යි.
    (2) දෙවිඳුන් අප කෙරෙහි ඇති ප්‍රේමයේ ගැඹුරයි.
    (3) දෙවිඳුන් හා අප අතර ඇති දුරස්ථභාවය යි.
    (4) මිනිසා හා නපුර අතර ඇති පරතරය යි.

03. ගීතාවලියේ කතුවරයා වන්නේ,
    (1) ජෙරමියා ය. (2) සාවුල් ය. (3) දාවිත් ය. (4) මෝසෙස් ය.

04. ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන් අතර සිටි අයකැමියෙක් වන්නේ,
    (1) මතෙව් හෙවත් ලෙවීය. (2) අන්තජාතිවාදී සීමෝන් ය.
    (3) ජුදස් ඉස්කාරියෝත් ය. (4) ජාකොබ් ගේ පුත් ජුදස් ය.

05. ''ගලීල මුහුද'' හඳුන්වන තවත් නමක් වන්නේ,
    (1) මධ්‍යධරනී මුහුද යි. (2) මළ මුහුද යි.
    (3) තිබේරියස් මුහුද යි. (4) රතු මුහුද යි.

06. ''ජේසුගේ ප්‍රේමේ විශාල පුදුමය වේ.'' ගීතිකාව නිර්මාණය කළේ,
    (1) ඉව්ලින් කානි තුමිය යි. (2) මයිකල් රොදිගු පියතුමා ය.
    (3) සැමුවෙල් සෙල්වරත්නම් තුමා ය. (4) ජොයිස් ද සිල්වා සොයුරිය යි.

07. ශ්‍රාවකයන්ට සුව කළ නොහැකි වූ රෝගියා වන්නේ,
    (1) යායිරසගේ දියණිය යි. (2) මී මැස්මොර රෝගිය යි.
    (3) ලාදුරු රෝගිය යි. (4) අංශභාග රෝගියා යි.

08. ''ආබ්‍රහම්ගේ පුත්‍රයා'' ලෙස ක්‍රිස්තුස්වහන්සේ හඳුන්වා දුන්නේ,
    (1) පේදුරුය. (2) ජොහාන් ය. (3) ස්තේපන් ය. (4) සාකෙවුස් ය.

09. ''සුදු අම්මා'' ලෙස හඳුන්වන්නේ,
    (1) ඉව්ලින් කානි තුමිය යි. (2) තෙරේසා මව්තුමිය යි.
    (3) ජොයිස් ද සිල්වාය. (4) එලීෂා ඇග්නස්ය.

10. ගලාති 5 : 22 අනුව ප්‍රේමය, ප්‍රීතිය, ඉවසීම, කරුණාව ....... යනාදිය හඳුන්වා දිය හැක්කේ,

(1) ශුද්ධාත්ම දීමනා ලෙස ය. (2) ශුද්ධාත්ම ඵල ලෙස ය.

(3) දේව දීමනා ලෙස ය. (4) යහපත් ගුණාංග ලෙස ය.

11. ''ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය'' ලෙස හඳුන්වා දුන්නේ,

(1) පේදුරු ය.

(2) ජුදස් ස්කාරියොත් ය.

(3) ඩොනල්ඩ් කනගරත්නම් අනුනායක තුමා ය.

(4) සෝමසිරි කුමාරදාස් දේවගැතිතුමා ය.

12. ''පොරොන්දු දේශය'' කරා යන ගමනේ දී ඊශ්‍රායෙල් ජනතාවට මග පෙන්වූයේ,

(1) වළාටැඹ හා ගිණි ටැඹයි. (2) සුළඟ හා ජල ටැඹයි.

(3) ජල ටැඹ හා තාරකාවයි. (4) සුළඟ හා තාරකාවයි.

13. ''දරුවා බාල වියේ දී ම යහමග යවන්න, එවිට ඔහු මහලු වියේ දීත් ඉන් ඉවත් ව නොයයි.''
මෙය සඳහන් වන ශු. බයිබලයේ ග්‍රන්ථය වන්නේ,

(1) ගීතාවලිය යි. (2) උත්පත්ති පොත යි.

(3) හිතෝපදේශය යි. (4) ලූක් සුභාරංචිය යි.

14. ඊශ්‍රායෙලවරුන්ගේ සීඝ්‍ර වර්ධනය පාලනයට පාරාවෝ ගත් ක්‍රියාමාර්ග පහත දැක්වේ.

A - වින්නඹුවන් ලවා උපතේ දී පිරිමි දරුවන් මරණයට පත් කරවීම.

B - උපදින සෑම පිරිමි දරුවෙක් ම නයිල් ගඟට විසි කිරීම.

ඉහත ක්‍රියාමාර්ග අතරින් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) පිළිතුරු දෙකම වැරදිය.

15. ''සමිදාණන් වහන්සේගේ ...................................... මා කෙරෙහි ඇත. මක්නිසාද .................................සුබ අස්න දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක.''
ඉහත හිස්තැනට ගැලපෙන වදන් පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) ආශිර්වාදය හා පව්කරුවන් ය. (2) ආශිර්වාදය හා දිළිඳුන්ට ය.

(3) ආත්මය හා දිළිඳුන්ට ය. (4) ආත්ම හා පව්කරුවන්ටය.

16. වර්මානයේ පවතින වහල්භාවයක් නොවන්නේ,

(1) සූදුව හා සුරාවයි (2) කාරුණික බව හා ගුණකරුක බවයි.

(3) මිල මුදල් හා ලෞකික සම්පත් ය. (4) කීර්තිය හා යසස්කාමය යි.

17. දෙවිදුන් මැවීම සඳහා භාවිත කළේ

(1) සුළඟ යි. (2) දූවිල්ල යි. (3) ගල් ය. (4) ජලය යි.

18. කිතුණුවෙකු සතු යහපත් ගුණාංගයක් වන්නේ,

(1) වෛරය යි. (2) පළිගැනීම යි. (3) ප්‍රේමය යි. (4) ක්‍රෝධය යි.

- **පහත වචන යොදා හිස් තැන් පුරවන්න.**

(ශ්‍රාවකයන් / පණතක් / ප්‍රේම කරන්න / ආඥාවක් / සාමය පතන්න / එකිනෙකාට)

19 මම ඔබට අලුත් ........................................................ දෙමි. එකිනෙකාට ........................................................
මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් ...................................................... ප්‍රේම කරන්න.

20. ඔබ එකිනෙකාට ප්‍රේම කරන්නාහු නම් එයින් ඔබ මාගේ ..............................................................................
බව සියල්ලෝ දැන ගනිති.

(ලකුණු 40 යි.)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (1) ''යළිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න.'' මෙම ප්‍රකාශය කළේ කාට ද?
 (2) දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබූ විශේෂ ජනතාව කව් ද?
 (3) අතිගරු ඇන්ඩෘ කුමාරගේ හිමිපාණන් අයත් වූ සභාව කුමක් ද?
 (4) ඔබ යාච්ඤා කරන අවස්ථා 02 ක් ලියන්න.
 (5) දෙවියන් වහන්සේ විසින් මවන ලද මුල් ම මිනිසුන් දෙදෙනා කවු ද?
 (6) ජේසුස් වහන්සේව පාවා දුන් ගෝලයා කවු ද?
 (7) ඊශ්‍රායෙල් සෙනඟ වහලුන් ලෙස සිටියේ කුමන රජු යටතේ ද?
 (8) දෙවියන් වහන්සේ මිනිසා මවා පදිංචි කළ උයන කුමක් ද?

02. (1) මිනිසා මැවිල්ල පිළිබඳ ව බයිබලයේ සඳහන්ව ඇති ග්‍රන්ථය කුමක් ද?
 (2) දේව කැමැත්ත ඉටු කිරීමට ඔබ කළයුතු දේවල් 03 ක් ලියන්න.
 (3) මැවිල්ල සුරැකීමට ඔබට කළ හැකි කාර්යන් 06 ක් ලියන්න.

03. (1) ඊශ්‍රායෙල් සෙනඟට නායකත්වය දීම සඳහා දෙවියන් වහන්සේ තෝරාගත් විශේෂ පුද්ගලයා කවු ද?
 (2) ඊශ්‍රායෙල් සෙනඟ දේව ආදරය අත්දුටු අවස්ථා 03 ක් ලියන්න.
 (3) ''අද මනුෂ්‍යයා විවිධාකාර වහල් බැමි වලට ගොදුරුව ඇත.'' එම වහල් බැමි 06 ක් ලියන්න.

04. (1) ශුද්ධ වූ බයිබලයේ ''ප්‍රේරිතයන්'' යැයි නම් කළේ කාට ද?
 (2) ජේසුස් වහන්සේගේ ගෝලයින් 06 දෙනෙක් නම් කරන්න.
 (3) කිතුණු දරුවෙකු ලෙස දේව මෙහෙවර උදෙසා ඔබට කළ හැකි කාර්යයන් 06 ක් ලියන්න.

05. (1) ''ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත.'' ජේසුස් වහන්සේ මේ ප්‍රකාශය කළේ කාට ද?
 (2) ජුදෙව් සමාජය තුළ පිළිගැනීමට ලක් වූ කණ්ඩායම් 03 ක් ලියන්න.
 (3) වර්තමාන සමාජයේ ප්‍රතික්ෂේප වූවන් වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 06 ක් ලියන්න.

06. (1) ඇණ කැළැල් දැක ජේසුස් වහන්සේව විශ්වාස කළ ගෝලයා කවු ද?
 (2) ජේසුස් වහන්සේ ගෙනසෙරත් විල අසල කැඳ වූ ගෝලයින් නම් කරන්න.
 (3) දේව කැඳවීම ලද දරුවෙකු ලෙස ඔබ තුළ වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග 06 ක් ලියන්න.

07. (1) ශුද්ධාත් ම දීමනා පිළිබඳ ව සඳහන් වන ශුද්ධ වූ බයිබලයේ ග්‍රන්ථය කුමක් ද?
 (2) ශුද්ධාත්ම දීමනා 03 ක් ලියන්න.
 (3) ශුද්ධාත් ම දීමනා ලද ඔබට කළ හැකි දේවල් 03 ක් ලියා එක් කරුණක් විස්තර කරන්න.

| 08 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය 2025 | ක්‍රිස්තියානි ධර්මය |
|---|---|---|

**පිළිතුරු පත්‍රය - I කොටස**

01. ( 1 ) 02. ( 2 ) 03. ( 3 ) 04. ( 1 ) 05. ( 3 ) 06. ( 4 ) 07. ( 2 ) 08. ( 4 ) 09. ( 1 ) 10. ( 2 )
11. ( 1 ) 12. ( 1 ) 13. ( 3 ) 14. ( 3 ) 15. ( 3 ) 16. ( 2 ) 17. ( 2 ) 18. ( 3 )

19. ආඥාවක් / ප්‍රේම කරන්න. 20. එකිනෙකාට / ශ්‍රාවකයන්

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) පේදුරු
(2) ඊශ්‍රායෙල් ජනතාව
(3) ලංකා සභාව
(4) උදෑසන අවදි වූ පසු, රාත්‍රී නින්දට යෑමට පෙර........ ආදී ශිෂ්‍ය පිළිතුරු..
(5) ආදම් හා ඒව
(6) ජුදස් ස්කාරියොත්
(7) පාරාවෝ
(8) ඒදන් උයන (ලකුණු 2 × 8 = 16)

02. (1) උත්පත්ති පොතය. (ල. 02)
(2) දෙවි පියාණන් කෙරෙහි පූර්ණ විශ්වාසය හා ඇදහිල්ල / දේව ගුණාංග තුළ ජීවිත සකසා ගැනීම....(ල. 03) ආදී පිටු අංක 03 ට අදාළ පිළිතුරු.
(3) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

03. (1) මෝසෙස් ය. (ල. 02)
(2) මන්නා හා වටුවන් ලැබීම. / මරා ස්ථානයේ දී ජලය මිහිරි රස වීම. / හොරේබ් පර්වතයෙන් ජලය ලබා දීම.
(ල. 03)
(3) මිල මුදල් / ලෞකික සම්පත් / කීර්තිය / යසස්කාමය / සුරාව / සූදුව ආදී පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.
(ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

04. (1) ජේසුස් වහන්සේගේ ගෝලයන් ය. (ල. 02)
(2) පිටු අංක 25 බලන්ය. (ල. 03)
(3) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

05. (1) සාකෙවුස්ට. (ල. 02)
(2) රජවරු / පූජකවරු / පරිසිවරු / විනයධරයන් (ල. 03)
(3) පිටු අංක 68 හා ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

06. (1) තෝමස් ය. (ල. 02)
(2) සීමෝන්, ඇන්ඩෘ, ජොහාන්, ජාකෝබ් (ල. 03)
(3) ශිෂ්‍ය පිළිතුරු සලකා ලකුණු දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

07. (1) 1 කොරෙන්ති (ල. 02)
(2) පිටු අංක 46 බලන්න. (ල. 03)
(3) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)